# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1825/38 - 2013 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2013.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 25/73.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්දානන්ද අලුත්ගමගේ,
ක්‍රීඩා අමාත්‍ය.

2013 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

2013 ජනවාරි මස 15 වැනි දින අංක 1793/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2013 අංක 1 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග, එහි 54(2) වන නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(3) ඉහත සඳහන් විධිවිධානවලින් කිසිවක කුමක් සඳහන්ව ඇත ද අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන කාර්යක් සඳහා හා නිශ්චය කරනු ලබන ආකාරයකට යම් ජාතික සංගමයක විශේෂ මහ සභා රැස්වීමක්, මහ සභා රැස්වීමක් හෝ කාරක සභා රැස්වීමක් කැඳවා පවත්වන ලෙස, අමාත්‍යවරයා විසින් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාට, අතිරේක ලේකම්වරයාට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධාන කරනු ලැබිය හැකි ය. එසේ කැඳවා පවත්වනු ලබන යම් රැස්වීමක් එම ජාතික ක්‍රීඩා සංගමයේ විධිමත් ලෙස පවත්වනු ලැබූ රැස්වීමක් ලෙස සලකනු ලැබිය යුතු ය."

09 - 390


1A - PG 01744 — 750 (2013/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*